# ලංසු සඳහා ආරාධනයයි
## දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.
## නිත්‍ය මගී සේවා අවසර පත්‍රය නිකුත් කිරීම

වලස්මුල්ල දිසා අධිකරණ නඩු අංක M-565 යටතේ ලබා දී ඇති නියෝගය පරිදි ගාල්ල දිසා අධිකරණ ඇස්කිසි අංක 37/23 දරණ නියෝගය යටතේ මාර්ග අංක 338/2 - මාතර - බෙලිඅත්ත - වීරකැටිය - මිද්දෙණිය බස් සේවාවේ කාලසටහන සහිත 003395 දරණ නිත්‍ය මගී සේවා අවසර පත්‍රය ප්‍රසිද්ධ ලංසු ආරාධනා කැඳවා අදාල වන්දි මුදල් ලබා ගැනීම සඳහා පැවරීමට තීරණය කර තිබේ. ඒ අනුව නිත්‍ය මගී සේවා අවසර පත්‍රය නිකුත් කිරීමට යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. නිත්‍ය මගී සේවා බලපත්‍ර සඳහා ලංසු පිරිනැමීම ගරු අධිකරණයේ එකඟතාවය යටතේ අධිකාරිය විසින් නිශ්චය කෙරේ. තවද ගරු දිසා අධිකරණයේ නියෝග යටතේ ගාල්ල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්වරයා සහ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ සම්බන්ධිකරණය සහිත කමිටුවක් යටතේ මෙම කටයුතු ගාල්ල දිසා අධිකරණ රෙජිස්ටාර්වරයා විසින් ක්‍රියාත්මක කෙරේ.

- එක් ලංසුවකට රු.50,000/- බැගින් ආපසු ගෙවනු ලබන ඇප මුදලක් තැන්පත් කල යුතුය.
- ලංසු සඳහා ආරාධනය කරනු ලබන මතු සඳහන් මාර්ගයට නියමිත කාලසටහනක් පවතින අතර ලංසු අයදුම්පත්‍රය සමග අදාල කාලසටහන් හා ගාස්තු සටහන් විස්තර දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ලබා දෙනු ලැබේ.

ලංසු තැබීම මගින් ලබාදෙනු ලබන මාර්ගය ගමනාන්ත අනෙකුත් සේවාවන්ට වන බලපෑම හා නීතිමය කරුණු මත දීර්ඝ කිරීමක් හෝ වෙනත් මාර්ග සඳහා සංශෝධනය කිරීමක් සිදු කරනු නොලැබේ.  මෙම මාර්ගයේ මගී අවශ්‍යතාවය මත සේවා තර කිරීමේදී ශ්‍රීලංගම සමග (60% - 40%) පදනම මත අනාගතයේ  සේවා තර කිරීම අධිකාරි බලතල වලට අදාළව සිදු කෙරේ. ඒ අනුව මාර්ග පරික්ෂා කර සේවා පවත්වා ගෙන යාමේ හැකියාව සලකා බලා පමණක් ලංසු වටිනාකම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමි. සේවා පිළිබඳ අවබෝධයකින් තොරව නිත්‍ය මගී සේවා අවසර පත්‍ර ලබා ගැනීම සඳහා ඉහල මිල ගණන් ඉදිරිපත් කොට ඒ මත පසුව අභියාචනා කිරීමේ අයිතියක් ඉල්ලුම්කරුට නොපවතී.

ලංසු හිමිකම ලබාගැනීමෙන් පසු දින 60 ක කාලය ඇතුලත නිත්‍ය මගී සේවා අවසර පත්‍රය ලබාගෙන බස් සේවාව ආරම්භ කල යුතුය. ප්‍රවාහන අධිකාරියේ මූලික නියමයන්ට අනුව කාලය දිර්ඝ කිරීමක් සිදු කරනු නොලැබේ. එහි වගකීම ආදාල පාර්ශවය විසින් දැරිය යුතුය.

### ලංසු තැබීම සඳහා ඉදිරිපත් කරනු ලබන මාර්ගය පිළිබඳ විස්තර

| ලංසු යොමු අංකය | මාර්ග අංකය | සේවාව | අනුමත ආසන ධාරිතාව | අවම ලංසු වටිනාකම රු. |
|---|---|---|---|---|
| 2025/OPR/FI/01 | 338/2 | මාතර - බෙලිඅත්ත - වීරකැටිය - මිද්දෙණිය | 54 වැඩි | 2,706,048.00 |

01. අභිලාෂී ලංසුකරුවන්හට සිංහල භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් ආපසු ගෙවනු නොලබන රුපියල් දෙදහසක (රු.2,000/-) ලංසුපත් ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව 2025/12/29 වන දින සිට 2026/01/27 දින දක්වා කාර්යාල දිනයන් තුල පෙ.ව. 8.30 සිට ප.ව 3.00 දක්වා දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ධාවන අංශයෙන් මිලදී ගත හැකිය.

02. අභිලාෂී යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන්හට වැඩිදුර තොරතුරු හා ලංසු ලිපි ලේඛන කාර්යාල වේලාව තුල අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදි නොමිලේ පරීක්ෂා කිරීම සිදු කල හැකිය.

03. ලංසු ඉදිරිපත් කලයුතු අවසාන දිනය 2026/01/28 වන දින 1130 පැය වන අතර එදින 1200 ට අධිකාරියේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාරයේදී ලංසු විවෘත කරනු ලැබේ.

04. නිසි පරිදි සම්පූර්ණ කර, මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් අනුපිටපතකින් යුක්තව ලියාපදිංචි තැපැලෙන් ගාල්ල, කොටුව, ලේන්බාන් විදීය, නො.67හි පිහිටි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති වෙත ලැබෙන සේ එවීම හෝ අධිකාරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම ලංසු ලබා ගන්නා අවසන් වේලාවට හෝ ඊට පෙර සිදු කල යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ මාර්ග අංක 338/2 - සාමාන්‍ය සේවා - 2025 යනුවෙන් සඳහන් කල යුතුය.

05. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු බව දැනුම් දෙනු ලැබේ. මෙම නියෝගය කඩ කරනු ලබන අයදුම්කරුවන්ගේ ලංසු අයදුම්පත විවෘත කරනු නොලැබේ. ඕනෑම ලංසුවක් පිලිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ගරු අධිකරණය නම්කර ඇති ඉහත කමිටුව සතු වේ.

මූලික තොරතුරු දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සියළුම දිස්ත්‍රික් කාර්යාල වලින් හෝ අංක :67, ලේන්බාන් විදිය, කොටුව, ගාල්ල ලිපිනයෙන් හෝ www.sprpta.lk වෙබ් අඩවියෙන් හා දුරකථන අංක 091- 2234237/091-2227074 මගින් විමසිය හැකිය.

**සභාපති**
**ද.ප.මා.ම.ප්‍රවාහන අධිකාරිය**
**ගාල්ල.**
**2025/12/29**